**ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2018 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බව තහවුරු කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟ විය යුතු වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල සඳහන් වටිනාකම් පදනම් කර නොගැනීම නිසා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා මූල්‍ය ප්‍රකාශ අතර ගිණුම් විෂයයන් 02 කට අදාළව රු.561,031,793 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟ විය යුතුවීම. | සිගාස් වැඩසටහනෙහි තක්සේරු කරන ලද වත්කම් වල වටිනාකම ඇතුළත් කිරීමට 2020 වර්ෂය දක්වා අවස්ථාව ලබාදී ඇති බැවින් 2019 වර්ෂය තුළදී එම වටිනාකම් ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන 36 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අමාත්‍යාංශයට අයත් සියළු වාහන පිරිවැය හෝ නැවත තක්සේරු වටිනාකම මත මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා අමාත්‍යාංශය විසින් අත්පත් කරගන්නා ලද රු.3,152,176,151 වටිනා මූල්‍ය නොවන වත්කම් ශේෂයක් තිබුණද ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම සහ සිගාස් වැඩසටහනෙහි ඇතැම් වත්කම්වල ආරම්භක ශේෂ ඇතුලත් කර නොමැති වීම හේතුවෙන් එම ශේෂයන්හි නිරවද්‍යතාවය තහවුරු නොවුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**1.6.3 ඉතුරුම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සවිය ණය යෝජනා ක්‍රමය යටතේ අමාත්‍යාංශය නමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක 2018 දෙසැම්බර් 31 දිනට පැවැති රු.56,035,968 ක බැර ශේෂය | අමාත්‍යාංශය නමින් පවත්වාගෙන යන බැංකු ගිණුම් ශේෂ අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වීම. | අදාළ නිරීක්ෂණ ලබාගැනීමට අභ්‍යන්තර, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වනු ලැබුවද එයට අයත් නොවූ බුද්ධශාසන හා වයඹ |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | | සංවර්ධන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කරන ලදී. පිළිතුරු ලද වහාම ඔබ වෙත යොමු කරමි. |

## 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුම පිළිබඳ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව එකතුව රු.1,426,149 ක ශේෂ නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය සහ අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය සමාන විය යුතු වීම. | මෙම වර්ෂයේදී එම ණය ශේෂ නිරවුල් කිරීමට තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.1,479,235 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදලක් ආපසු ගෙවා අවසන්වීමට පෙර විශ්‍රාම ගන්නා වූ හෝ මිය යන්නා වූ හෝ සේවය අවසන් වන්නා වූ හෝ නිලධාරියෙකු සහ රාජ්‍ය සංස්ථාවකට මුදා හරිනු ලබන නිලධාරියෙකුගේ ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **පුද්ගල පඩිනඩි ලේඛනය** | | |
| | පුද්ගල පඩිනඩි ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව 17 වැනි භාණ්ඩාගාර හා විගණන ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මු.රෙ. 453 ප්‍රකාරව යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | **විගණන විමසුම් ලේඛනය** | | |
| | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගත යුතු වීම. | දැනටමත් පවත්වාගෙන යන අතර එය විධිමත්ව ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | **ඇප ලේඛනය** | | |
| | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | සකස් කරමින් පවතී. |
| (ඈ) | **හානි පිළිබඳ ලේඛනය** | | |
| | හානි පිළිබඳ ලේඛනය අංශ කිහිපයක පමණක් තොරතුරු ඇතුළත් කර පවත්වා ගෙන ගොස් තිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛන පවත්වාගෙන යනු ලැබේ. |
| (ඉ) | **බැරකම් පිළිබඳ ලේඛනය** | | |

| | | | |
|---|---|---|---|
| | --------------------------<br>බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. | යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඊ) | **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**<br>-------------------------- | | |
| | මාර්ගෝපදේශ ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් යාවත්කාලින කර පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | දැනටමත් සාමාජිකයින්ගේ අත්සන් ලේඛනයක් ලබාගන්නා අතර එය විධිමත්ව ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (16) (2) උප වගන්තිය | සෑම අස්ථිත්වයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන සමඟ රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තාද ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 කාර්යසාධන වාර්තාව | පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වීම. | එම වාර්තාව 2019 මැයි 31 දින විගණකාධිපති වෙත ලබාදීමට කටයුතු කර තිබේ. |

| | | | |
|---|---|---|---|
| | 2019 පෙබරවාරි 28 දින වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 565 (5) | එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කෙරෙන මාසික තැන්පතු සාරාංශ ඊළඟ මාසය අවසාන වීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් තැන්පතු ගිණුම් 05කට අදාළ 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මාසික තැන්පතු සාරාංශ විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මින් ඉදිරියට එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 880 (1) | අමාත්‍යාංශයේ චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ඉදිරියේදී විධිමත් පරිදි ඇපලේඛනය පවත්වා ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 පෙබරවාරි, අප්‍රේල් සහ සැප්තැම්බර් මාසවල හැර අනිකුත් මාසවල ඉල්ලුම් කළ අග්‍රිමය | වාර්ෂික අග්‍රිම අවශ්‍යතාවය නිසිපරිදි සැලසුම් කළ යුතුවීම. | ඇතැම් මාසවල ඉල්ලුම් කළ අග්‍රිමය, සැලසුම් කළ අග්‍රිමය ඉක්මවා වැඩිවීමට හේතුවූයේ පෙර මාසවලදී |

| | | |
|---|---|---|
| සැලසුම් කළ අග්‍රිමය ඉක්මවා සියයට 3ක සිට සියයට 137ක් දක්වා ප්‍රමාණයකින් වැඩි වී තිබුණු අතර, ඒ අනුව වර්ෂයේ අග්‍රිම අවශ්‍යතාවය නිසි පරිදි සැලසුම් කර නොතිබුණි. | | ඉල්ලුම් කරන ලද අග්‍රිම ප්‍රමාණයට වඩා අඩු අක්මුදල් ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කළ නිසාවෙනි. වාර්ෂික අග්‍රිම අවශ්‍යතාවය නිසි පරිදි සැලසුම් කළ ද ඉල්ලුම් කළ ප්‍රමාණයම නොලැබීම නිසා අග්‍රිම සීමාව ඉහළ දැමීමට සිදුවිය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 45 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 3,361.28 ක ප්‍රතිපාදන වලින් එකතුව රු.මිලියන 2,271.07 ක් උපයෝජනය කර නොතිබුණු අතර, එම වැය විෂයයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25ක සිට සියයට 100ක දක්වා වූ සැලකිය යුතු පරාසයක පැවතිණි. | මු.රෙ.50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | කාර්යක්ෂම හා අරපිරිමැස්මෙන් භාවිතා කිරීම, අක්මුදල් නොලැබීම, අමාත්‍යාංශ වෙනස්වීම, අතැති බිල්පත් හා බැරකම් පැවතීම, අමාත්‍යාශ දෙකක් මගින් වියදම් දැරීම නිසා වියදම් කළමනාකරණය දුෂ්කර වීම, නිලධාරීන් පුහුණු කටයුතු යෙදවීමට නොහැකි වීම, විදේශ ගමන් සීමා කිරීම, අලුත් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමට නොහැකි වීම, අමාත්‍යාංශ විෂය පථය වෙනස් වීමත් සමඟ සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම, දේශපාලන අස්ථාවර තත්ත්වය, සංවර්ධන කටයුතු සඳහා භූමිය නොලැබීම, අතිකාල සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය පැන නොනැගීම, අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම ආදි හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු වී ඇත. |
| (ආ) | මෙහෙයුම් වැඩ සටහන යටතේ වැය විෂයයන් 05 ක් සහ සංවර්ධන වැඩ සටහන යටතේ වැය විෂයයන් 11ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබා දී | -එම- | වැය විෂයන් නිවැරදි කර ගැනීමට නොහැකි වීම, අතැති බිල්පත් හා බැරකම්වලට බැඳී සිටීම සඳහා ප්‍රතිපාදන ඉතිරි වීම, අක් මුදල් නොලැබීම හේතුවෙන් අතැති බිල්පත් හා බැරකම් වලට බැඳී |

| | | | |
|---|---|---|---|
| | තිබුණු රු.මිලියන 756.01 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 751.22 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය සියයට 43ක සිට සියයට 100 අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | | සිටිම අමාත්‍යාංශය අවස්ථා 03 කදී සංශෝධනය වීම නිසා මධ්‍යස්ථාන විවෘත කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සීමා වීම, අපේක්ෂිත පරිදි නඩත්තු වියදම් ඇති නොවීම, සංවර්ධන කටයුතු සඳහා භූමිය නොලැබීම වැනි හේතූන් නිසා ඉතිරිවීම් සිදු වී ඇත. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ----------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.මිලියන 2.76 ක වටිනාකම බැරකම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | වර්ෂයට අදාළ බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුවීම. | රු.497,905 ක වවුචර්පත් අතපසු වීම හේතුවෙන් බැරකම් ලේඛනයට ඇතුලත් කිරිමට නොහැකි විය. ඉතිරි වටිනාකම් වවුචර් කිහිපයක් එකතු වී සමුච්චිත ශේෂයන් ලෙස දක්වා තිබේ. |
| (ආ) | ගිවිසුම්ගත සේවා සහ අනිකුත් සේවා සඳහා 2018 සහ 2019 වර්ෂ සඳහා ගෙවූ වියදම් අනුපාතික කොට 2018 වර්ෂයට අදාල කොටස පමණක් බැරකම් ලෙස ගතයුතු වුවත් අවස්ථා 5 කදී රු.243,075 ක් බැරකම් හඳුනාගත නොහැකි ලෙස දක්වා තිබුණි. | -එම- | ගිවිසුම්ගත සේවා සහ අනිකුත් සේවා සඳහා 2018 සහ 2019 යන වර්ෂ දෙකෙහි වියදම් බොහෝ අවස්ථාවල එකම වවුචර්පතෙහි අන්තර්ගත වී ඇති නිසා වර්ෂ දෙකකට වියදම වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම අපහසු වේ. නමුත් මින් ඉදිරියේදී එවැනි අතපසු වීම් සිදු නොකිරීමට කටයුතු කරමි. |

**2.4 තැන්පත් ශේෂයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කොන්ත්‍රාත් සඳහා රුඳවුම් මුදල් තැන්පත් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 63.48 ක ශේෂයක් විය. එම ශේෂ තුළ වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු.මිලියන 9.28ක් වූ තැන්පතු 24 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | රුඳවුම් මුදල් සම්බන්ධයෙන් අදාළ ආයතනවලින් ප්‍රතිචාර දැක්වූ වහාම රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව වූ රු.මිලියන 14.07 ක හඳුනා නොගත් ගෙවීම් සම්බන්ධයෙන් බැංකුවෙන් තොරතුරු විමසා ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිරීක්ෂණය වන හඳුනා නොගත් ගෙවීම් පිළිබඳව අමාත්‍යාංශය විසින් බැංකුවෙන් තොරතුරු විමසීම වහාම සිදුකර ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුවීම. | හඳුනානොගත් ගෙවීම් ගිණුම්ගත කිරීමට අදාළව පහසුවෙන් තොරතුරු ලබාගැනීම සඳහා බැංකු සැසඳුම් විෂයට අදාළව නිල බැංකු ගිණුම හරහා සිදුවන විදේශ විනිමය ගණුදෙනු වෙනුවෙන් වෙනමම ගොනුවක් ආරම්භ කර පවත්වා ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද ඒ සමඟ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර සහ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන මුදල් අවශ්‍යතා සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අවශ්‍ය කරුණු ඇතුලත් කොට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේදී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවද 2018 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 110ක සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමට අමාත්‍යාංශය අපොහොසත්ව තිබුණි. | මෙම වැඩසටහනේ අරමුණ ඉටු කරගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතුවීම. | විශ්ව විද්‍යාල සහ පාසල් තුළද සංස්කෘතික මධ්‍යස්ථාන පවත්වාගෙන යන බැවින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක එක් සංස්කෘතික මධ්‍යස්ථානයකට වඩා පිහිටුවා තිබේ. |
| (ආ) | සංස්කෘතික මධ්‍යස්ථාන 09 ක් ඉදිකිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන | ඉලක්කගත කාලය තුළ වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර නිවැරදි පිරිවැය | මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබීම නිසා ඉදිකිරීම කඩින් කඩ සිදු කිරීම |

| | | | |
|---|---|---|---|
| | 93.8 ක් වැයකර තිබූ අතර එම ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 05 කට වැඩි කාලයක් ගතකර තිබුණු නමුත් 2019 පෙබරවාරි මාසය වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවී තිබේ. |
| (ඇ) | සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේදී භූමිය නායයෑම්, යුධමය තත්ත්ව වැනි හේතූන් මත මධ්‍යස්ථාන 03 ක් ඉදිකිරීම් ආරම්භ කර අතරමඟ නවතා දමා තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 4.26 ක් වැය කර තිබුණි. | සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා තෝරාගන්නා ඉඩම් වල අයිතිය, පාරිසරික තත්ත්වය පිළිබඳ සොයා බැලීමෙන් පසුව ගැටළු නොමැති ස්ථාන වල ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුවීම. | කහවත්ත,සමන්තුරේ,පේසාලේ යන සංස්කෘතික මධ්‍යස්ථාන භූමිය නායයෑම්, යුධමය තත්ත්ව වැනි හේතූන් මත අතරමැද නවතා දමා ඇත. |
| (ඈ) | ක්‍රියාකාරී සැලැස්මේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,258.3 ක් වූ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 42 ක හා පිරිවැය රු.මිලියන 38.1 ක පුනරාවර්තන ක්‍රියාකාරකම් 39 ක් ඇතුළත් කර සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට යෝජිත ක්‍රියාකාරකම් දක්වා තිබුණි. එසේ වුවද ක්‍රියාකාරී සැලැස්මට අනුරූපීව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණු හෙයින් කාර්යසාධනය පරීක්ෂා කළ නොහැකි විය. | අමාත්‍යාංශය විසින් වර්ෂයක් තුළ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන සහ පුනරාවර්තන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ කාර්තුමය ප්‍රගති වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවීම. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු ව්‍යාපෘතිය යටතේ වන ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන485ක් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 28 ක් සහ රු.මිලියන 126.5ක් වූ පුනරාවර්තන ක්‍රියාකාරකම් 10 ක ප්‍රගතිය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂා කරන | වර්ෂයක් තුළ ඉලක්කගත ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට | වෙයන්ගොඩ පිහිටි ජාතික පුහුණු වැඩ කටයුතු සඳහා 2018 වර්ෂයේ වෙන්වූ ප්‍රතිපාදන මුදලින් ඉතිරි මුදල |

| | | |
|---|---|---|
| ලද දේශිය දැනුම හා සංස්කෘතික අගයන් පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම්, සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානය හා වේයන්ගොඩ, ශිල්ප ගම්මාන වැඩසටහන යන ක්‍රියාකාරකම් 03 ක භෞතික ප්‍රගතිය සියයට 10 ක සිට සියයට 50 ක් අතර ප්‍රමාණයක පැවතුණි. | කටයුතු කළ යුතුවීම. | ශිල්ප කලා ගම්මාන වැය විෂයට නිසි පරිදි මාරු කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ii)නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් සහ පවත්නා සංස්කෘතික මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.මිලියන 300ක් ප්‍රතිපාදන සලසා තිබුණද රු.මිලියන 303.86ක් වැයකර තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 90 ක් පමණක් විය. | නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු මෙන්ම ඇස්තමේන්තු ඉක්මවා වියදම් නොකළ යුතු අතර ඉලක්කගත භෞතික ප්‍රගතිය ළඟා කරගැනීමට ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතුවීම. | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රු.මිලියන 300ක ප්‍රතිපාදන සලසා දී තිබුණද සත්‍ය වශයෙන්ම රු.මිලියන 550ක් පමණ අවශ්‍ය වේ. එම අවශ්‍ය ප්‍රතිපාදන ලබාදුන්නේනම් භෞතික ප්‍රගතිය ඉලක්කගත පරිදි ළඟාකර ගත හැකිව තිබුණි. |
| (iii) ව්‍යාපෘති 04 ක භෞතික ප්‍රගතිය සියයට 100 ක් වූ නමුත් අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 3.4 ක සිට සියයට 30 ක දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රු.මිලියන 300ක ප්‍රතිපාදන සලසා දී තිබුණද සත්‍ය වශයෙන්ම රු.මිලියන 550ක් පමණ අවශ්‍ය විය. එම අවශ්‍ය ප්‍රතිපාදන ලබාදුන්නේනම් භෞතික ප්‍රගතිය ඉලක්කගත පරිදි ළඟාකර ගත හැකිව තිබුණි. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | ------------- | -------------------------------- |
| | රජයේ රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන යටතේ වයඹ පළාත තුළ දී වසර 05ක කාලයක ස්වයං රැකියා, කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේදී අමාත්‍යාංශයට රු.මිලියන 500 ක් චක්‍රීය ණය අරමුදල් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ 2016 වර්ෂයේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කර බැංකුව වෙත රු.මිලියන 500 ක් නිදහස් කර තිබුණි.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| **(අ)** | අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අමතරව වයඹ ප්‍රාදේශීය සංවර්ධන සමුපකාර සමිතිය සමඟ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අවබෝධතා ගිවිසුමට එළඹ තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් යෝජනා අනුව මෙම ව්‍යාපෘතිය රාජ්‍ය බැංකුවක් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා | අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම ගිවිසුම් සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු මෙන්ම අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් යෝජනා අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුවීම. | අදාළ නිරීක්ෂණ ලබාගැනීමට අභ්‍යන්තර, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වනු ලැබුවද එයට අයත් ගොනු බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයට භාරදෙන ලද බව දන්වා තිබුණි. ඒ අනුව අදාල නිරීක්ෂණ ලබා ගැනීමට එම අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කරන ලදී. පිළිතුරු ලද වහාම ඔබ වෙත යොමු කරමි. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ලැබී තිබුණද ඊට පටහැනිව මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. | | |
| **(ආ)** | ණයපොලී ආදායමෙන් අදාල බැංකුවේ පරිපාලන හා අනෙකුත් ගාස්තු අඩු කිරීමෙන් පසු ඉතිරිය චක්‍රීය අරමුදලට බැර කළ යුතුය. එකී උපදෙස් වලට පටහැනිව 2018 ජුලි 31 දින වනවිට ණය මත පොලිය වූ රු.මිලියන 17.08 ක් වයඹ ප්‍රාදේශිය සංවර්ධන බැංකුව යටතේ පැවති සී/ස වයඹ ප්‍රාදේශිය සංවර්ධන සමුපකාර සමිතියේ ගිණුමකට බැර කර තිබුණි. | 2016 නොවැම්බර් 25 දිනැති අංක BD/HR 163/9/01-VOL II දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කළ යුතු වීම. | -එම- |
| **(ඇ)** | ව්‍යාපෘතිය සඳහා අත්තිකාරම් මුදල් ලබාදීමේදී එහි ශක්‍යතාවය තහවුරු කර මේ සඳහා යොදවන මුදල් අපතේ නොයන පරිදි කටයුතු කළ යුතු බව දක්වා තිබුණ ද බැංකුව වෙත අත්තිකාරම් ලබාදීමේදී ශක්‍යතාවය තහවුරු කරගත් බවට කිසිදු සාක්ෂියක් නොවීය. | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ 2016 ඔක්තෝබර් 03 දිනැති අංක 16/946/722/014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ නිරීක්ෂණවලට අනුව කටයුතු කල යුතු වීම | -එම- |
| **(ඇ)** | සවිය ණය යෝජනා ක්‍රමය යටතේ 2016 නොවැම්බර් සිට 2018 ජූනි දක්වා වයඹ පළාත තුළ පදිංචි ව්‍යවසායකයන් සඳහා රුමිලියන . 511.57 ක ණය ප්‍රදානය කර තිබු අතර ඉන් 2018 ජූනි වන විට අයනොවූ ණය මුදල රු.මිලියන 26.41 ක් පමණ විය. | ව්‍යාපෘතිය ඇරඹීමට පෙර මෙම ණය මුදල් ආපසු අයකර ගැනීමේ හැකියාව සහ ණය අයකර ගැනීමට අදාළ කොන්දේසි අවබෝධතා ගිවිසුමට ඇතුලත් කළ යුතු වීම. | -එම- |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංස්කෘතික මධ්‍යස්ථානවල සිටින දක්ෂ ශිල්පීන් යොදවාගෙන 2018 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ‘‘කුවන්නා’’ නමින් නෘත්‍ය නාටකයක් නිර්මාණය කර රඟ දැක්වීම සඳහා රු.මිලියන8.4 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ‘‘කුවන්නා’’ නෘත්‍ය නාටකයේ වියදම් දැරීම සඳහා අවස්ථා 7 කදී රු.මිලියන14.74 ක් වටිනා ඇස්තමේන්තු 7ක් සකස් කර තිබුණද මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මේ සඳහා සමස්ත පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොමැති අතර පිරිවැය ඇස්තමේන්තු 07 ක් පමණක් සකස් කර අදාළ වියදම් දරා ඇත. මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) ප්‍රකාරව කටයුතු කරමි. |
| | (ii) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශ ප්‍රකාරව මුද්‍රා තැබූ මිලගණන් ලබා | -එම- | අමාත්‍යාංශ ලේකම්තුමාගේ විශේෂ අනුමැතිය මත අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති රංඟ වස්ත්‍රාභරණ හා රංග භාණ්ඩ සැපයීමේ ප්‍රවීණයන්ගෙන් මිල ගණන් |

| | | | |
|---|---|---|---|
| | ගැනීමෙන් තොරව ශිල්පීන්ගේ රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීමට රු.මිලියන1.98 ක්ද, රංග භාණ්ඩ හා වේදිකා පසුතල නිර්මාණය වෙනුවෙන් රු.766,000 ක් හා සමස්ත වැඩසටහනෙහි ආහාරපාන සඳහා රු.මිලියන 2.11 ක්ද වැය කර තිබුණි. | | කැඳවීමට කටයුතු කළ අතර වැඩසටහනට සහභාගීවන්නන්ට ආහාර සැපයීම සඳහා මුද්‍රා තැබූ මිලගණන් කැඳවීමට කාලය ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රවර්ධන අංශයේ ඉල්ලී මත අතින් හා ෆැක්ස් මගින් මිලගණන් කැඳවීමට සිදු විය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු වාහන 28 කට අදාළව සමීක්ෂණ පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647 (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාහන 40 ක් පමණක් භෞතිකව පරීක්ෂා කළ අතර විවිධ හේතූන් මත ඉතිරි වාහන භෞතිකව පරීක්ෂා කිරීමට නොහැකි විය. |
| (ආ) | ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ දක්වා තිබුණු තක්සේරු වටිනාකම රු.මිලියන 287.13 ක් වන ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල අයිතිය 2018 දෙසැම්බර් 31 දින වනවිටත් අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි. | වත්කම් විධිමත්ව පවරාගෙන පරිහරණය කළ යුතු වීම. | මෙම ඉඩම් අමාත්‍යාංශයට පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

## 3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව 2019 මැයි දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට අමාත්‍යාංශය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව කටයුතු කළයුතුවීම. | විගණන විමසුම් සඳහා එක් එක් අංශ වෙතින් නිරීක්ෂණ ලබා ගැනීමට යම් කාලයක් ගත වන බැවින් පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී ඇත. ඉදිරි දිනවල පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකය, ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතුවල නියුක්ත වූ අයගේ පාලනයෙන් නිදහස්ව තිබිය යුතු නමුත් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියාට දෙවන අත්සන්කරු ලෙස චෙක්පත් අත්සන් කිරීමේ බලය පවරා තිබුණු අතර ඒ හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය කඩ වී තිබුණි. | මුදල් රෙගුලාසි මු.රෙ. 134 (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය, ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතුවල නියුක්ත වූ අයගේ පාලනයෙන් නිදහස්ව තිබිය යුතුවීම. | ප්‍රධාන ගණකාධිකාරිවරිය විශ්‍රාම ගොස් සිටි බැවින් වෙනත් සුදුසු නිලධාරියකු සොයා ගැනීමට නොහැකි වීම මත ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියාගේ නම බැංකුවට යැවූ නමුදු කිසිදු අවස්ථාවක එම නිලධාරියාගේ අත්සන චෙක්පතට යොදා නොමැත. |